පොලිස් මාධ්‍ය කොට්ඨාසය
பொலிஸ் ஊடகப் பிரிவு
POLICE MEDIA DIVISION
14 වන මහල,සුහුරුපාය,බත්තරමුල්ල

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| දිනය Date | 2025.01.14 පැය 0800 | දුරකථන අංකය Tel.NO | 011-2887973 | මගේ අංකය My NO | D/Media/Out/58 /2025 | විද්‍යුත් ලිපිනය E-Mails | dir.media@police.gov.lk |


**අයිස් මත්ද්‍රව්‍ය සහ හෙරොයින් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - නවගමුව පොලිස් ස්ථානය.**

වැඩබලන පොලිස්පතිතුමාගේ උපදෙස් මත දිවයින පුරා ක්‍රියාත්මක අපරාධ හා මත්ද්‍රව්‍ය නිවාරණ මෙහෙයුමට අදාලව නවගමුව පොලිස් ස්ථානයේ නිලධාරීන්ට ලද තොරතුරක් මත ආවේක්ෂ රාජකාරි යොදවා විමර්ශන සිදුකිරීමෙන් අනතුරුව 2025.01.13 වන දින සවස් කාලයේදී නවගමුව පොලිස් වසමේ කොරතොට ප්‍රදේශයේදී ත්‍රීරෝද රථයෙන් තම නිවසට පැමිණි පුද්ගලයෙකු ඔහුගේ නිවස අසලදී රථය නවතා පරීක්ෂා කිරීමේදී, සැකකරු සන්තකයේ තිබී **අයිස් මත්ද්‍රව්‍ය කිලෝග්‍රෑම් 04 ග්‍රෑම් 300 ක්, හෙරොයින් ග්‍රෑම් 792** ට **ආසන්න** ප්‍රමාණයක් හා මත්ද්‍රව්‍ය ජාවාරමෙන් උපයාගත් බවට සැකකරන රුපියල් 120,000 ක මුදලක් සමඟ අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 37 ක් වන කොරතොට ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

නවගමුව පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබන අතර ශ්‍රී ලංකා පොලිසිය තවදුරටත් මෙම මෙහෙයුම දිවයින පුරා අඛණ්ඩව සිදුකරනු ලබයි.

ඡායාරූප කිහිපයක්





**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**